**නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතිය - 2017**

-----------------------------------------------------------------------------------------------------------

නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ 2017 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2009 ජූලි 23 දින එළඹි අංක ජීඑස්-එෆ්එස්පී-5-එල්කේ දරන ප්‍රදාන ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වර්තමානයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ සුනාමි බලපෑමට ලක්වූ ගෝලීයව වැදගත්වන පරිසර පද්ධති පිළිබඳ ප්‍රධාන ප්‍රවාහය ප්‍රතිස්ථාපනය හා කළමනාකරණ සංරක්ෂණය සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට යොමුකිරීම මඟින් තිරසාර ජීවන රටාවට සහායවීම සහ දේශගුණික විපර්යාසයන්ගෙන් පීඩාවට පත්වීම අවම කිරීමයි. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,985 කට සමාන එජඩො මිලියන 14.84 කි. ඉන් ගෝලීය පාරිසරික පහසුකම සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලින් පිළිවෙලින් එජඩො මිලියන 7.27 ක් හා එජඩො මිලියන 7.08 ක් මූල්‍යයනය කරනු ලබයි. තවද, ලෝක සංරක්ෂණ සංගමයෙන් එජඩො මිලියන 0.06 ක් මූල්‍යයනය කිරීමට හා සහ ශ්‍රී ලංකා රජයෙන් රු. මිලියන 55.90 ක් වන දායකත්වයක් කරනු ලබයි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 10 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 10 වනවිට නිම කිරීමට නියමිතව තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2017 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලේ ව්‍යාපෘති විගණනය සඳහා වූ මාර්ගෝපදේශවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 සැප්තැම්බර් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඈ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතන විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලේ ව්‍යාපෘති විගණනය සඳහා වන මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙනයනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණු බව සහ 2017 සැප්තැම්බර් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2017 සැප්තැම්බර් 30 දක්වා හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 සැප්තැම්බර් 30 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතන | 14.41 | 1,929.10 | 200.00 | 0.28 | 43.27 | 6.29 | 851.18 |
| ශ්‍රී ලං ර | 0.43 | 55.90 | 15.30 | 0.10 | 15.05 | 0.30 | 44.60 |
| එකතුව | 14.84 | 1,985.00 | 215.30 | 0.38 | 58.32 | 6.59 | 895.78 |

ඉහත තොරතුරු අනුව, ප්‍රදාන නියෝජිතායතන විසින් වෙන් කරන ලද රු.මිලියන 1,929.10 කට සමාන එජඩො මිලියන 14.41 ක් වූ මුළු ප්‍රදාන මුදලින් රු.මිලියන 851.18 කට සමාන එජඩො මිලියන 6.29 ක මුදලක් පමණක් ව්‍යාපෘති කටයුතු අවසන් වන විට උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ප්‍රධාන වෙරළාශ්‍රිත පරිසර පද්ධති පිළිබඳ ඵලදායී ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය සඳහා වඩා යහපත් ක්‍රම සංවර්ධනය හා ප්‍රදර්ශනය කිරීම, ඵලදායී පරිසර පද්ධති ප්‍රධාන ප්‍රවාහයන් සිදුකිරීම සහ තිරසාර කළමනාකරණය, වෙරළාශ්‍රිත ප්‍රජාවන් බලගැන්වීම සහ ඉගෙනීම, ඇගයීම් හා යොදා ගැනීම් කළමනාකරණය ආදි ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් යටතේ අරමුදල වෙන්කර තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව, ඉහත සඳහන් ප්‍රධාන කාර්යයන් යටතේ සිදු කළ යුතු උප කාර්යයන් 71 ක් 2017 සැප්තැම්බර් 30 දිනට අවසන් කර තිබුණි. කෙසේ වුවද, විගණකවරු විසින් සිදුකරන ලද ස්ථානීය නිරීක්ෂණවලදී ව්‍යාපෘතිය විසින් වැඩිදියුණු කල සමහර පහසුකම් ව්‍යාපෘතියේ අරමුණුගත ප්‍රයෝජන ලඟාකර ගැනීම සඳහා උපයෝජනය කරනු නොලබන බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොතුවිල් කොට්ටකාල් කලපුව වටා සීමා ලකුණු කිරීම හා කලපුව සංරක්ෂණය සඳහා කණු 700 ක් කැනීම සඳහා ව්‍යාපෘතිය 2014 වර්ෂයේ රු.මිලියන 1.60 ක් වැය කර තිබුණි. 2018 මාර්තු 27 දින සිදුකරන ලද විගණන පරික්ෂාවේදී, කිලෝ මීටර් 02 ක දුරක තනන ලද කණු 68 කින් කණු 05 ක් පමණක් දක්නට ලැබුණි. තවද, ප්‍රදේශයේ පදිංචිකරුවන් අනවසරයෙන් අල්ලා ගෙන එහි ස්ථිර ගොඩනැගිලි ඉදිකර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) පොතුවිල් කොට්ටුකාල් වැලිපරය සංරක්ෂණය හා සීමා ලකුණු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ගෙන තිබූ පියවර මහජන විරෝධය නිසා අත්හැර දමා තිබුණි. මේ සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 0.80 ක පිරිවැයකට මිලදීගෙන තිබූ කණු 300 ක් අදාල ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව 2018 මාර්තු 27 දින වන විටත් බිමෙහි තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) අනවසර වැලි කැනීම්වලින් පොතුවිල් වැලිපරය ආරක්ෂාකර ගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 6.10 ක පිරිවැයකට මායිම් තාප්පයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. මෙම අක්‍රමවත් මායිම් තාප්පය ඉදිකිරීමෙන් ප්‍රදේශයේ ජනතාව බලවත් දුෂ්කරතාවයන්ට පත්වී තිබූ අතර යාබද මධ්‍යම බෙහෙත් ශාලාව වැලි වලින් සම්පූර්ණයෙන් යටවී තිබූ අතර ප්‍රවේශ මාර්ගය අර්ධ වශයෙන් යටවී තිබුණි.

(ඈ) වෙරළ බඩ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ව්‍යාපෘතිය රු.මිලියන 6.90 ක පිරිවැයකට වාහරෙයි පනිචෙන්කර්නි ප්‍රදේශයේ කලපු සෆාරි සඳහා ප්‍රදීපාගාරයක් සහිත බෝට්ටු පැවැත්වීමේ අංගනයක්, අමුත්තන්ගේ ශාලාවක් හා කලපු උද්‍යානයක් ඉදිකර තිබුණි. වාහරෙයි ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රජාමූල සංවිධාන හරහා ස්වයං සේවා නියුක්ති අවස්ථා සංවර්ධනය කිරීම් වස් 2017 නොවැම්බර් 29 දින මෙම ගොඩනැගිල්ල හා අනෙකුත් වැඩිදියුණු කිරීම් වාහරෙයි ප්‍රදේශීය සභාව වෙත පවරා දී තිබුණි. කෙසේ වුවද, 2018 මාර්තු 31 දින වන විටත් ඉදිකළ ගොඩනැගිල්ල, සෆාරි බෝට්ටු අංගනය හා කලපු උද්‍යානය භාවිතයට ගැනීමකින් තොරව පැවතිණි.

(ඉ) ව්‍යාපෘතිය විසින් රු.මිලියන 3.40 ක පිරිවැයක් දරා ඉදිකර තිබූ වාහරෙයි පරිසර හිතකාමී උද්‍යානය 2014 දෙසැම්බර් 26 දින වාහරෙයි ප්‍රාදේශීය ලේකම්ට භාරදී තිබූ අතර ඒ අවට පඳුරුවලින් වැඩී නිෂ්ක්‍රියව පැවතුණු බව 2018 මාර්තු 04 දින සිදුකල ස්ථානීය පරික්ෂණයේදී අනාවරණය විය. එමනිසා, ජෛව පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ ජනතාවට මහ පෙන්වීම් ලබාදීමට හා අනුවර්තනය සඳහා වූ පරිසර හිතකාමී උද්‍යානයක් ඉදිකිරීමේ අරමුණු ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) ජලය සැපයීමට නොහැකිවීම නිසා රු.මිලියන 12.80 ක පිරිවැයකට ඉදිකර 2016 මාර්තු 26 දින කුච්චවේලි ප්‍රාදේශීය සභාවට පවරා දුන් කොම්පෝස්ට් අංගනය 2018 මාර්තු 31 දින වන විටත් භාවිතයට ගැනීමකින් තොරව අදාල යන්ත්‍රද සමඟ නිෂ්ක්‍රීයව පැවතිණි.